THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

05204 - මූලික කළමනාකරණ ගණකාධිකරණය සහ ව්‍යාපාර මූල්‍ය ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - II

2014 මාර්තු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

හිමිකම් ඇවිරිණි.

පිළිතුරු අංක 01

(අ)(i) **විකුණුම් අයවැය (රු.) - 2014 /2015**

නිෂ්පාදිතය	ඒකක	විකුණුම් මිල	මුළු ආදායම
සම්මත	50,000	6,000	300,000,000
සුපිරි	10,000	8,000	80,000,000
			380,000,000

(ii) **නිෂ්පාදන අයවැය (ඒකක වලින්) - 2014 /2015**

	සම්මත	සුපිරි
අයවැයගත විකුණුම්	50,000	10,000
එකතු කළා: ඉලක්කගත අවසාන නිමි භාණ්ඩ තොගය	11,000	500
	61,000	10,500
අඩු කළා: ආරම්භක නිමි භාණ්ඩ තොගය	(1,000)	(500)
අයවැයගත නිෂ්පාදනය	60,000	10,000

(iii) **ඍජු ද්‍රව්‍ය භාවිත අයවැය (ඒකක වලින් සහ වටිනාකම් වලින්) - 2014/2015**

	පදම්කල රබර්	වීදුරු	එකතුව
ඒකක වලින්			
සම්මත ජනේල 60,000 ක් සඳහා අවශ්‍යතාවය	720,000	360,000	
සුපිරි ජනේල 10,000 ක් සඳහා අවශ්‍යතාවය	120,000	80,000	
මුළු භාවිතය	840,000	440,000	
	රු.	රු.	රු.
(වටිනාකම් වලින්)			
ඒකකයක පිරිවැය	70	100	
මුළු භාවිතයේ පිරිවැය	58,800,000	44,000,000	102,800,000

සෘජු ද්‍රව්‍ය මිලදී ගැනුම් අයවැය (ඒකක වලින් සහ වටිනාකම් වලින්) - 2014/2015

ඒකක වලින්	පදම්කල රබර් (බෝඩ්)	වීදුරු (වර්ග අඩි)
නිෂ්පාදනය සඳහා භාවිතය	840,000	440,000
එකතු කළා : ඉලක්කගත අවසාන තොගය	80,000	20,000
මුළු අවශ්‍යතාවය	920,000	460,000
අඩු කළා : ආරම්භක තොගය	(70,000)	(60,000)
මිලදී ගත යුතු ප්‍රමාණය	850,000	400,000

(වටිනාකම් වලින්)	රු.	රු.	එකතුව රු.
ඒකකයක පිරිවැය	70	100	
මුළු මිලදීගැනීමේ වටිනාකම	59,500,000	40,000,000	9,500,000

(v) සෘජු නිෂ්පාදන ශ්‍රම පිරිවැය අයවැය - 2014 /2015

	සම්මත	සුපිරි	එකතුව
නිෂ්පාදනය කළයුතු ප්‍රමාණය	60,000	10,000	
ඒකකයක සඳහා සෘජු ශ්‍රම පැය ගණන	4	6	
අවශ්‍ය මුළු ශ්‍රම පැය ගණන	240,000	60,000	300,000
පැයක ශ්‍රම අනුපාතය			200
මුළු ශ්‍රම පිරිවැය (රු.)			60,000,000

(ආ) පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත

(i) නිෂ්පාදන පොදුකාර්ය සඳහා (යන්ත්‍ර සකස්කිරීමේ පොදුකාර්ය හැරුණු විට)

	එකතුව
මුළු පොදුකාර්ය පිරිවැය (රු.)	90,000,000
මුළු සෘජු නිෂ්පාදන ශ්‍රම පැය ගණන	300,000
ශ්‍රම පැයක් සඳහා පොදුකාර්ය පිරිවැය (රු.)	300

	සම්මත	සුපිරි
ඒකකයක සඳහා සෘජු ශ්‍රම පැය ගණන	4	6
ඒකකයක් සඳහා අන්තර්ග්‍රහණය කළයුතු පොදුකාර්ය පිරිවැය (රු.)	1,200	1,800

(ii) යන්ත්‍ර සකස්කිරීමේ පොදුකාර්ය

	සම්මත	සුපිරි	එකතුව
නිෂ්පාදනය කළයුතු ප්‍රමාණය	60,000	10,000	
කාණ්ඩය තුළ ඇති ඒකක සංඛ්‍යාව	50	40	
කාණ්ඩ ගණන	1,200	250	
සකස් කිරීමේ කාලය - කාණ්ඩයකට ශ්‍රම පැය ගණන	10	12	
මුළු යන්ත්‍ර සකස් කිරීමේ කාලය (පැය)	12,000	3,000	15,000
මුළු යන්ත්‍ර සකස් කිරීමේ පොදුකාර්ය (රු.)			30,000,000
පැයක් සඳහා යන්ත්‍ර සකස් කිරීමේ පොදුකාර්ය (රු.)			2,000
කාණ්ඩයක් සඳහා යන්ත්‍ර සකස් කිරීමේ පොදුකාර්ය (රු.)	20,000	24,000	
ඒකකයක් සඳහා යන්ත්‍ර සකස් කිරීමේ පොදුකාර්ය (රු.)	400	600	

(ඇ) ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය (රු.)

	සම්මත (St)	සුපිරි (De)
පදම්කළ රබර්	840	840
වීදුරු (St:100x6 සහ De: 100x8)	600	800
සෘජු නිෂ්පාදන ශ්‍රමය (St:200x4 සහ De: 200x6)	800	1,200
සෘජු නිෂ්පාදන පොදුකාර්ය	1,200	1,800
යන්ත්‍ර සකස් කිරීමේ පොදුකාර්ය	400	600
ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය	3,840	5,240

(ඇ) අවසාන තොග අයවැය

	ප්‍රමාණය	ඒකකයක් සඳහා පිරිවැය (රු.)	මුළු පිරිවැය	(රු.)
සෘජු ද්‍රව්‍ය				
පදම්කළ රබර් (බෝඩ්)	*80,000*	70	5,600,000	
වීදුරු (වර්ග අඩි)	*20,000*	100	2,000,000	7,600,000
නිමි භාණ්ඩ				
සම්මත (ඒකක)	11,000	3,840	42,240,000	
සුපිරි (ඒකක)	500	5,240	2,620,000	44,860,000
මුළු අවසාන තොගය				52,460,000

විකුණුම් පිරිවැය අයවැය

	රුැ.	රුැ.
සෘජු ද්‍රව්‍ය භාවිත		102,800,000
සෘජු නිෂ්පාදන ශ්‍රමය		60,000,000
නිෂ්පාදන පොදුකාර්ය (90 m + 30 m)		120,000,000
		282,800,000
ආරම්භක නිමි භාණ්ඩ තොගය	6,460,000	
අවසාන නිමි භාණ්ඩ තොගය	(44,860,000)	
		(38,400,000)
විකුණු භාණ්ඩවල පිරිවැය		244,400,000

		විකුණුම් ප්‍රමාණය	ප්‍රමිත පිරිවැය	විකුණුම් පිරිවැය
හෝ	සම්මත	50,000	3,840	192,000,000
	සුපිරි	10,000	5,240	52,400,000
				244,400,000

පිලිතුරු අංක 02

(අ)

	දොන් (රුැ.)	කී (රුැ.)
ඒකකයක විකුණුම් මිල	1,000	1,500
ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය	(600)	(1,000)
ඒකකයක විචල්‍ය අලෙවිකිරීමේ පිරිවැය	(150)	(350)
ඒකකයක සඳහා සහභාගය	250	150
ඒකකයක් සඳහා සාමාන්‍ය යන්ත්‍ර පැය ගණන	1.0	0.5
යන්ත්‍ර පැයක් සඳහා සහභාගය (රුැ.)	250	300

1 සටහන : පහත දක්වා ඇති 1 වන සහ 2 වන විකල්පයක් යටතේ, විශේෂිත ඇණවුම මත නිපදවිය යුතු 'දොන' ඒකක 10,000 ට අදාල සහභාගය, එම විකල්පයන් 2 කටම පොදු බැවින්, නොසලකා හැරිය හැකිය. එබැවින්, 1 වන විකල්පය යටතේ රුැ. මිලියන 9 ක අදාල ප්‍රතිලාභයකුත් , 2 වන විකල්පය යටතේ , රුැ. මිලියන 10 ක අදාල ප්‍රතිලාභයකුත් ලැබේ.

1 වන විකල්පය

ඉහත ශ්‍රේණිගත කිරීම අනුව, 'කී ' නිෂ්පාදනය සඳහා මූලිකත්වය දෙන්නේ නම්, 'දොන ' ඒකක 10,000 (අවම අවශ්‍යතාවය) කුත් 'කී ' ඒකක 80,000 (ඉතිරි පැය 40,000/0.5) කුත් නිෂ්පාදනය කළ යුතුය.
ප්‍රතිඵලය පහත පරිදි වේ.

	රු.
දොන් 10,000 ක් සඳහා සහභාගය (250 x 10,000)	2,500,000
කී 80,000 ක් සඳහා සහභාගය (150 x 80,000)	12,000,000
මුළු සහභාගය	14,500,000
අධි - තාක්ෂණික යන්ත්‍රයේ කුලී පිරිවැය	(3,000,000)
ශුද්ධ අදාල ප්‍රතිලාභය	11,500,000

2 වන විකල්පය

'දොන් ' නිෂ්පාදනය කිරීම සඳහා සියළුම සාමාන්‍ය යන්ත්‍ර පැය යොදාගනු ලබන්නේ නම්, 'දොන් ' ඒකක 50,000 ක් නිපදවිය හැකිය.
ප්‍රතිඵලය පහත පරිදි වේ.

	රු.
සහභාගය / ශුද්ධ අදාල ප්‍රතිලාභය (250 x5,000)	12,500,000

සාමාන්‍ය යන්ත්‍ර පැයකට උපරිම සහභාග ආන්තිකය (Contribution margin) , 'කී ' නිෂ්පාදිතය මගින් ජනනය කළද, අධි-තාක්ෂණික යන්ත්‍රය සඳහා දැරීමට සිදුවන අවම පිරිවැය හේතුවෙන්, පළමු විකල්පය යටතේ ලැබෙන නිෂ්පාදිත මිශ්‍රයෙන් ලැබෙන මෙහෙයුම් ලාභයට වඩා වැඩි මෙහෙයුම් ලාභයක්, 'දොන් ' නිෂ්පාදිතය පමණක් නිෂ්පාදනය කිරීමෙන් ලබාගත හැකිවේ.

එබැවින් , 'දොන් ' නිෂ්පාදිතය, සම්පූර්ණයෙන්ම සාමාන්‍ය යන්ත්‍ර පැය යොදාගෙන නිෂ්පාදනය කරන්නේ නම්, මෙහෙයුම් ලාභය උපරිම කිරීමට හැකිවේ. එබැවින්, 'දොන් ' නිෂ්පාදිත ඒකක 50,000 ක් නිපදවිය යුතුය.

(ආ) ශ්‍රේණිගත කිරීම අනුව, 'කී ' නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීම සඳහා මූලිකත්වය දෙන්නේ නම් , 'දොන් ' ඒකක 10,000 (අවම අවශ්‍යතාවය) කුත් සහ 'කී ' ඒකක 130,000 කුත් (ඉතිරි පැය 65,000/0.5) නිෂ්පාදනය කළ යුතුය.

ප්‍රතිඵලය පහත පරිදි වේ.

	රු.
දොන් 10,000 ක් සඳහා සහභාගය (250 x10,000)	2,500,000
කී 130,000 ක් සඳහා සහභාගය (150 x130,000)	19,500,000
මුළු සහභාගය	22,000,000
යන්ත්‍ර ධාරිතාවය වැඩිකිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය	(1,500,000)
අධි - තාක්ෂණික යන්ත්‍රයේ කුලී පිරිවැය	(3,000,000)
ශුද්ධ අදාල ප්‍රතිලාභ	17,500,000

සෑම සාමාන්‍ය යන්ත්‍ර පැයක්ම 'දොන් ' නිෂ්පාදනය කිරීම සඳහා යෙදවූයේ නම් 'දොන් ' ඒකක 75,000 ක් නිපදවිය හැකිවේ.

ප්‍රතිඵලය පහත පරිදි වේ.

	රු.
සහභාගය / ශුද්ධ ආදළ ප්‍රතිලාභ(250 x65,000)	18,750,000
ධාරිතාවය වැඩිකිරීම හිඟ වැඩිවන පිරිවැය	(1,500,000)
	17,250,000

එබැවින් , නව නිෂ්පාදිත මිශ්‍රය විය යුත්තේ 'දොන් ' ඒකක 10,000 ක් සහ 'කී ' ඒකක 130,000 කි.

මෙහෙයුම් ලාභය රු. 5,000,000 ක් ඉහළ යනු ඇත. (17,500,000 - 12,500,000)

(ඇ)

	දොන් (රු.)	කී (රු.)	බුල් (රු.)
ඒකකයක විකුණුම් මිල	1,000	1,500	1,200
ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය	(600)	(1,000)	(700)
ඒකකයක විචල්‍ය අලෙවිකිරීමේ පිරිවැය	(150)	(350)	(150)
ඒකකයක සහභාගය	250	150	350
සාමාන්‍ය යන්ත්‍ර පැය ගණන	1.0	0.5	1.0
යන්ත්‍ර පැයක් සඳහා සහභාගය (රු.)	250	300	350

සීමාකාරී සම්පත් ඒකකයකට උපරිම සහභාගය ලබාදෙන බැවිනුත්, අධි - තාක්ෂණික යන්ත්‍ර වෙනුවෙන් දැරීමට සිදුවන කුලී පිරිවැය ආදී අතිරේක පිරිවැයක් දැරීමට අවශ්‍ය නොවන බැවිනුත්, බුල් වඩාත් සුදුසු ලෙස සැලකිය හැකිය.

එබැවින්, විශේෂ ඇණවුම භාරගත යුතුය.

විශේෂ ඇණවුම භාරගත් විට 'බුල් ' ඒකක 20,000 ක් සහ 'දොන් ' ඒකක 10,000 ක් නිපදවිය හැකි අතර ඒ සඳහා සාමාන්‍ය යන්ත්‍ර පැය 30,000 ක් අවශ්‍ය වේ. ඒ අනුව 'දොන් ' හෝ 'කී ' නිපදවීම සඳහා යන්ත්‍ර පැය 45,000 ක් ඉතිරි වේ.

යන්ත්‍ර පැය 45,000 ක් යොදාගෙන 'කී ' නිපදවුවහොත්, මෙහෙයුම් ලාභය වනුයේ, 45,000 x 300 - 3,000,000 = රු. 10,500,000 කි.

යන්ත්‍ර පැය 45,0 00 ම යොදාගෙන 'දොන් ' නිපදවුවහොත් , මෙහෙයුම් ලාභය වනුයේ,
45,000 x 250 = රු. 11,250,000 කි.

එබැවින්, ඉතිරි යන්ත්‍ර පැය ගණන යොදාගෙන 'දොන් ' ඒකක 45,000 ක් නිපදවිය යුතුය.

එම නිසා නිෂ්පාදිත මිශ්‍රය සහ ලාභය පහත පරිදි වේ.

	රු.
'දොන් ' ඒකක 55,000 (55,000 x 250)	13,750,000
'බුල් ' ඒකක 20,000 (20,000 x 350)	7,000,000
මුළු සහභාගය	20,750,000
ධාරිතාවය වැඩිකිරීමේ පිරිවැය	(1,500,000)
මෙහෙයුම් ලාභය	19,250,000

පිළිතුරු අංක 03

(අ) පිළිගෙවුම් කාල ක්‍රමය මගින් , මුළු ආයෝජනය සම්පූර්ණයෙන්ම නැවත අය කර ගැනීමට හැකිවන කාලය පිළිබඳව මනිනු ලැබේ. මේ සදහා, වට්ටම් නොකළ සහ වට්ටම් කල යන මුදල් ප්‍රවාහ දෙකම යොදගත හැකිය.

මෙම ක්‍රමයෙහි පහත දුර්වලතා දක්නට ලැබේ.

.

- මෙමමගින්, පිළි ගෙවුම් කාලසීමාවට පසු උපයනු ලබන මුදල් ප්‍රවාහයන් පිළිබදව සළකනු නොලැබේ.
- වට්ටම් නොකළ පිළිගෙවුම් කාලසීමාව මගින් මුදලේ කාල අගය සළකනු නොලැබේ. එබැවින්, එමගින් ශුද්ධ වර්තමාන අගය සෘණ (-) වන ව්‍යාපෘතියක් ද නිර්දේශ කළ හැකිය.
- ව්‍යාපෘති ඇගයීමේදී ඒවා ශ්‍රේණිගත කිරීමේ දී මෙමගින් වැරදි ශ්‍රේණිගත කිරීම් ලබාදිය හැකිය.
- මෙමගින් ව්‍යාපෘතියේ ලාභදායිකත්වයේ ප්‍රමාණය පිළිබදව පෙන්නුම් නොකෙරේ.

කෙසේ වෙතත්, පහත සදහන් අවස්ථාවලදී, පිළිගෙවුම් කාල ක්‍රමය බහුලව භාවිතා කෙරේ.

- ද්‍රවශීලතා ප්‍රශ්න ඇති බැවින් ප්‍රාග්ධනය ඉක්මණින් ආපසු ගෙවීම අවශ්‍ය කරන ආයතන වල ව්‍යාපෘති ශ්‍රේණිගත කිරීම සදහා.
- වේගවත් සැලසුම් සහ නිෂ්පාදිත වෙනස්කම් සහිත අවිනිශ්චිත වෙළඳපොළවල් වල කර ඇති අවදානම් ආයෝජන ඇගයීමේදී.
- අනාගත මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම ඉතාමත් දුෂ්කර විට.
- අනෙකුත් ඇගයීම් ක්‍රම සමග ඒක්ව සලකා බලන විට.
- සෑම මට්ටමකම කළමණාකරුවන්ට පහසුවෙන් තේරුම්ගත හැකි නිසා.

රු.'000

මුදල් ප්‍රවාහ	0 වසර	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර
බිම් මහල හා පළමු මහල අතර ඉදිවන අතර මැදි මහල	(50,000)					5,000
බිම් නඩත්තු කිරීම්	-	(1,000)	(1,000)	(1,000)	(1,000)	(1,000)
පුවරු සහිත ට්‍රක් රථ	(5,000)	-	-	-	-	-
එසවුම් යන්ත්‍රයෙන් අහිමි ආදායම්	-	(1,200)	(1,200)	(1,200)	(1,200)	(1,200)
කුලී ඉතිරිකිරීම (W1)	-	41,800	7,800	7,800	7,800	7,800
ආරක්ෂක වියදමින් ඉතිරිය	-	600	600	600	600	600
ප්‍රවාහයෙන් ඉතිරිය	-	1,300	1,300	1,300	1,300	1,300
ගමනාගමනයෙන් ඉතිරිය	-	100	100	100	100	100
ශුද්ධ මුදල් ප්‍රවාහ	(55,000)	41,600	7,600	7,600	7,600	12,600
DF (15%)	1,000	0.870	0.756	0.658	0.572	0.490
DCF	(55,000)	36,192	5,746	5,001	4,347	6,260

NPV 2,548

NPV ධන අගයක් ගන්නා බැවින්, බිම් මහල හා පළමු මහල අතර ඉදිවන අතරමැදි මහලේ ආයෝජනය කිරීමට නිර්දේශ කෙරේ.

පෙරවැඩ 1

	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර
අදාල වර්ෂයන් සඳහා කුලිය	15,600	15,600	15,600	15,600	15,600
50% අත්තිකාරම් ගෙවීම්	(7,800)	(7,800)	(7,800)	(7,800)	(7,800)
කලින් ගෙවූ කුලිය නැවත ලැබීම	39,000	-	-	-	-
ගිවිසුම අවලංගු කිරීමේ ගාස්තුව	(5,000)	-	-	-	-
කුලියෙන් ඇතිවන ඉතිරිය	41,800	7,800	7,800	7,800	7,800

- එසවුම් යන්ත්‍රයේ සුන්බුන් වටිනාකම, වැඩිවන ආදායමක් ලෙස සළකනු නොලැබේ. එයට හේතුව වන්නේ, එය දැනට ඇති යන්ත්‍රයක් වීමය.
- ආරක්ෂක සේවකයන්ට ගෙවන ලද පරණ වැටුප් අදාල නොවේ.
- විශේෂඥයාට ගෙවන ලද ගාස්තුව, දැනටමත් දරා ඇති බැවින් එය අදාල නොවේ.
- දැනට සිටින මෙහෙයුම් (Handling) ශ්‍රමිකයන්ගේ වැටුප් ද වැඩිවන පිරිවැයක්/ වළක්වාගත හැකි පිරිවැයක් නොවේ.
- ගබඩා කළමණාකරුගේ වැටුප් ද වැඩිවන පිරිවැයක් වළක්වාගත හැකි පිරිවැයක් ලෙස නොසැලකේ.

විකල්ප පිළිතුර

පලමු මහල හා බිම් මහල අතර ඇතිවන අතරමැදි මහලට අදාල මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය

රු 000

මුදල් ප්‍රවාහ	0 වසර	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර
අතර මැදි මහල	(50,000)					5,000
මහල නඩත්තු කිරීම්	-	(1,000)	(1,000)	(1,000)	(1,000)	(1,000)
පුවරු සහිත ට්‍රක් රථ	(5,000)	-	-	-	-	-
ගිවිසුම අවලංගුකිරීමේ ගාස්තුව	-	(5,000)	-	-	-	
ශුද්ධ මුදල් ප්‍රවාහ	(55,000)	(6,000)	(1,000)	(1,000)	(1,000)	4,000
DF (15%)	1,000	0.870	0.756	0.658	0.572	0.497
DCF	(55,000)	(5,220)	(756)	(658)	(572)	1,988
NPV	**(60,218)**					

විකල්ප පිළිතුර

අතරමැදි මහලේ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය

රු 000

මුදල් ප්‍රවාහ	0 වසර	1 වසර	2 වසර	3 වසර	4 වසර	5 වසර
අතර මැදි මහල	(50,000)					5,000
මහල නඩත්තු කිරීම්	-	(1,000)	(1,000)	(1,000)	(1,000)	(1,000)
පුවරු සහිත ට්‍රක් රථ	(5,000)	-	-	-	-	-
ගිවිසුම අවලංගුකිරීමේ ගාස්තුව	-	(5,000)	-	-	-	
ශුද්ධ මුදල් ප්‍රවාහ	(55,000)	(6,000)	(1,000)	(1,000)	(1,000)	4,000
DF (15%)	1,000	0.870	0.756	0.658	0.572	0.497
DCF	(55,000)	(5,220)	(756)	(658)	(572)	1,988
NPV	**(60,218)**					

වර්තමානයේ ඇති බාහිර ගබඩාවට අදාල මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය

මුදල් ප්‍රවාහ	**0 වසර**	**1 වසර**	**2 වසර**	**3 වසර**	**4 වසර**	**5 වසර**
එසවුම් යන්ත්‍රයෙන් ආදායම	-	1,200	1,200	1,200	1,200	1,200
ආරක්ෂක වියදම්	-	(600)	(600)	(600)	(600)	(600)
ප්‍රවාහන වියදම්	-	(1,300)	(1,300)	(1,300)	(1,300)	(1,300)
ගමනාගමනය	-	(100)	(100)	(100)	(100)	(100)
කුලී වියදම්	-	(46,800)	(7.800)	(7.800)	(7.800)	(7.800)
ශුද්ධ මුදල් ප්‍රවාහ	-	(47,600)	(8,600)	(8,600)	(8,600)	(8,600)
DF (15%)	1.000	0.870	0.756	0.658	0.572	0.497
DCF	-	(41,412)	(6,502)	(5,659)	(4,919)	(4,274)
NPV	**(62,766)**					

පිළිතුර අංක 04

(අ) දැනට පවතින ක්‍රමය අනුව

	රු.
ද්‍රව්‍ය පිරිවැය	64,474,000
ශ්‍රම පිරිවැය	6,000,000
නිෂ්පාදන පොදු කාර්ය	5,000,000
මුළු බද්ධ පිරිවැය	75,474,000
අඩුකළා : අතුරු නිෂ්පාදන විකුණුම්	(474,000)
ශුද්ධ බද්ධ පිරිවැය	75,000,000
මුළු නිමවුම	300,000
ඒකකයකට පිරිවැය	250.00

	A නිෂ්පාදිතය	B නිෂ්පාදිතය	C නිෂ්පාදිතය
විකුණුම් මිල	275.00	425.00	520.00
නිමවුම් (ඒකක)	158,000	94,800	47,200
විකුණුම්	43,450,000	40,290,000	24,544,000
මුළු විකුණුම්			108,284,000
මුළු පිරිවැය			(75,000,000)
ශුද්ධ ලාභය			**33,284,000**

(ආ)

පසුගිය මාස 6 සඳහා A නිෂ්පාදිතයේ නිමැවුම	158,000
E නිෂ්පාදිතයේ අපේක්ෂිත නිමැවුම	150,100
E නිෂ්පාදිතයේ කි.ග්‍රෑ. 1 ක විකුණුම් මිල	330
E නිෂ්පාදිතය විකිණීමෙන් ජනිත වූ අතිරේක විකුණුම්	49,533,000
A නිෂ්පාදිතයේ අහිමිවූ විකුණුම්	(43,450,000)
තවදුරටත් පෙරසැර්ගත කිර්මේ අතිරේක විචල්‍ය පිරිවැය	(7,505,000)
තවදුරටත් පෙරසැර්ගත කිර්මේ අතිරේක ස්ථාවර පිරිවැය(මිලියන 0.2 * මාස 6	(1,200,000)
සමාගමට වන ශුද්ධ අලාභය	(2,622,000)

තවදුරටත් පෙරසැර්ගත කිර්මෙන් රු. මිලියන 2.622 ක අලාභයක් සිදුවන බැවින්, A නිෂ්පාදිතය තවදුරටත් පෙර්සැර්ගත නොකිර්මට කළමණාකරණය විසින් ගෙන ඇති තීරණය, වලංගු තීරණයකි.

(ඇ)

- රසායන ද්‍රව්‍ය වල විකුණුම් මිල ගණන්, එකම මට්ටමක නොපැවතීම.
- එක් එක් රසායන ද්‍රව්‍යයෙන් ලැබෙන ප්‍රතිලාභය මත පිරිවැය බෙදා වෙන්කළ යුතු වීම.
- බර මත පදනම්ව, පිරිවැය බෙදා වෙන්කිර්ම ඉතාමත් සරල වුවත්, එමගින් රසායන ද්‍රව්‍ය වල උපලබ්ධි වටිනාකම (ප්‍රතිලාභය) නොසලකා හැරේ. එබැවින්, මෙවැනි අවස්ථාවලදී වඩාත්ම සුදුසු ක්‍රමය වන්නේ, විකුණුම් වටිනාකම මත පදනම්ව පිරිවැය බෙදාහැර්මය.

(ඈ) අතුරු නිෂ්පාදිතයේ විකුණුම් අඩුකළ පසු මුළු බද්ධ පිරිවැය

	බෙදා වෙන්කළ අවස්ථාවේ විකුණුම් වටිනාකම (රු.)	**විභජනය කළ පිරිවැය (රු.)**	**නිමවුම (ඒකක)**	**ඒකකයක පිරිවැය (රු.)**
A නිෂ්පාදිතය	43,450,000.00	30,094,473.79	158,000	190.47
B නිෂ්පාදිතය	40,290,000.00	27,905,784.79	94,800	294.36
C නිෂ්පාදිතය	24,544,000.00	16,999,741.42	47,200	360.16
	108,284,000.00	75,000,000.00	300,000.00	

(ඉ)

	රු.
E නිෂ්පාදිත කි.ග්‍රෑ. 1 ක වර්තමාන මිල	330.00
කි.ග්‍රෑ. 1 කට ආනයන බද්ද	100.00
කි.ග්‍රෑ. 1 ක් සඳහා වෙළඳපොලේ ඇතිවිය හැකි අවම මිල	430.00
E නිෂ්පාදිතයෙන් අතිරේක විකුණුම් (430 x 150,100)	64,543,000
මුළු අතිරේක පිරිවැය	(8,705,000)
A නිෂ්පාදිතයෙන් විකුණුම් අහිමි වීම	(43,450,000)
තවදුරටත් පෙරසැරිගත කිරීමේ අතිරේක ප්‍රතිලාභය	**12,388,000**

හෝ

ආනයන බද්ධ නිසා මිල වැඩිවීම හේතුවෙන් ඇතිවන අතිරේක ආදායම

= 100 * 150,100	15,010,000
ඉහත (ආ) කොටසට අනුව, ශුද්ධ අලාභය	(2,622,000)
තවදුරටත් පෙරසැරිගත කිරීමේ අතිරේක ප්‍රතිලාභය	**12,388,000**

E නිෂ්පාදිතය තවදුරටත් පෙරසැරිගත කරන්නේ නම්, බදුවල බලපෑම සලකා බැලීමෙන් පසුව පවා, මෙහි අතිරේක ප්‍රතිලාභයක් පවතින බැවින්, අනාගතයේදී E නිෂ්පාදිතය නිෂ්පාදනය කරන ලෙස කළමණාකරනයට උපදෙස් දිය හැකිය.

පිළිතුරු අංක 05

(අ) (i) ඒකකයකට ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය = 75,000,000 / 3,000

= ත්‍රී රෝද රථයකට (TW) රු. 25,000

(ii) ඒකකයක පිරිවැය (රු.)

විචල්‍ය නිෂ්පාදන පිරිවැය	98,000
ඒකකයකට ස්ථාවර නිෂ්පාදනය පොදුකාර්ය	25,000
ඒකකයකට මුළු නිෂ්පාදන පිරිවැය	123,000

		ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
(iii)	විකුණු ඒකක ගණන	2,000	2,900	3,200
	නිෂ්පාදනය කළ ඒකක ගණන	3,200	2,400	3,800
	තොගයේ වැඩිවීම / අඩුවීම	1,200	(500)	600
	ආරම්භක තොගය	-	1,200	700
	අවසාන තොගය	1,200	700	1,300

(ආ) මෙහෙයුම් ලාභය - අන්තර්ග්‍රහණ පිරිවැය (රු' 000)

		ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
ආදායම	160 දී	320,000	464,000	512,000
විකුණු භාණ්ඩවල පිරිවැය				
ආරම්භක තොගය	123 බැගින්	-	147,600	86,100
විචල්‍ය නිෂ්පාදන පිරිවැය	98 බැගින්	313,600	235,200	372,400
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	25 බැගින්	80,000	60,000	95,000
විකිණීම සඳහා ඇති භාණ්ඩවල පිරිවැය		393,600	442,800	553,500
අවසාන තොගය	123 බැගින්	(147,600)	(86,100)	(159,900)
		246,000	356,700	393,600
නිෂ්පාදන විචලතාවයන් සඳහා ගැලපුම් (W1)		5,000	(15,000)	20,000
විකුණුම් භාණ්ඩවල මුළු පිරිවැය		241,000	371,700	373,600
මෙහෙයුම් ලාභය		79,000	92,300	138,400
ප්‍රසාද දීමනාව (රු'000)	0.50% බැගින්	395	462	692

(W1)		ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
නිෂ්පාදන අතිරික්තය / ඌනතාවය		200	(600)	800
ගැලපුම්	25 බැගින්	5,000	(15,000)	20,000

(ඇ) මෙහෙයුම් ලාභය - ආන්තික පිරිවැය (රු'000)

		ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
ආදායම 160 බැගින්		320,000	464,000	512,000
විකුණු භාණ්ඩවල පිරිවැය				
ආරම්භක තොගය	98 බැගින්	-	117,600	68,600
විචල්‍ය නිෂ්පාදන පිරිවැය	98 බැගින්	313,600	235,200	372,400
විකිණීම සඳහා ඇති භාණ්ඩවල පිරිවැය		313,600	352,800	441,000
අවසාන තොගය	98බැගින්	117,600	68,600	127,400
විකුණු භාණ්ඩවල විචල්‍ය පිරිවැය		196,000	284,200	313,600
සහභාගය		124,000	179,800	198,400
ස්ථාවර නිෂ්පාදන පිරිවැය		75,000	75,000	75,000
මෙහෙයුම් ලාභය		49,000	104,800	123,400
ප්‍රසාද දීමනාව (රු'000)	0.50% බැගින්	245	524	617

(ඇ)

	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
අන්තර්ග්‍රහණ පිරිවැය යටතේ ප්‍රසාද දීමනාව	395.00	461.50	692.00	1,548.50
ආන්තික පිරිවැය යටතේ ප්‍රසාද දීමනාව	245.00	524.00	617.00	1,386.00
වෙනස	150.00	(62.50)	75.00	162.50

ක්‍රම දෙක යටතේ ප්‍රසාද දීමනාව වෙනස්වීමට හේතුව වන්නේ, එක් එක් ක්‍රමය යටතේ නිෂ්පාදනයේ සහ විකුණුම් වල ඇති වෙනස නිසාය.

එනම්, තොගයේ වෙනස නිසාය.

	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
(අ) (iii) අනුව තොගයේ වැඩිවීම / අඩුවීම	1,200	(500)	600

අන්තර්ග්‍රහණ පිරිවැය යටතේ, තොගය ගොඩනගා ගැනීම නිසා ඒකකයකට රු. 25,000 බැගින් ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය ප්‍රාග්ධන කිරීමට CEO ට හැකියාව ලැබේ.

මෙමගින් ඒකකයකට රු. 125 (25,000 * 0.5%) බැගින් ප්‍රසාද දීමනාවක් ලැබේ.

විකුණුම් වලට වඩා නිෂ්පාදනය වැඩිවන විට, අන්තර්ග්‍රහණ පිරිවැය යටතේ මෙහෙයුම් ලාභය, ආන්තික පිරිවැය යටතේ මෙහෙයුම් ලාභයට වඩා වැඩිවේ. මාස 3 ක කාලච්ඡේදය පුරාවට, තොගයේ ගොඩනැගීම ඒකක 1300 ක් වන අතර, එමගින් ප්‍රසාද ගෙවීමේ රු. 162,500 (125 * 1,300) ක වෙනසක් ඇති වේ.

විකුණුම් පිළිබඳව තැකීමකින් තොරව, නිෂ්පාදනය වැඩිකිරීම තුලින් CEO විසින් ප්‍රතිලාභ ලබනු ඇත. එබැවින්, එහි පතිඵලයක් ලෙස, තොගය ද ගොඩනැගෙන අතර, තොග පවත්වාගෙන යාමේ පිරිවැය ද වැඩිවිය හැකිය.

<u>පිළිතුරු අංක 06</u>

(අ)

	<u>රු.</u>
සෘජු ද්‍රව්‍ය 1 (1,210,000/5,500)	220.00
සෘජු ද්‍රව්‍ය 11 (7,040,000/5,500)	1,280.00
සෘජු ශ්‍රමය (660,000/5,500)	120.00
විචල්‍ය පොදුකාර්ය (412,500/5,500)	75.00
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය (275,000/5,500)	<u>50.00</u>
බැගයක ප්‍රමිත පිරිවැය	1,745.00
හෝ	
(9,597,500/5,500)	1,745.00

(ආ)

විකුණුම්	5,500.00
අඩුකළා : ආරම්භක නිමි භාණ්ඩ(349,000/1745)	(200.00)
එකතුකළා : අවසාන නිමි භාණ්ඩ(872,500/1745)	500.00
නිෂ්පාදිත ඒකක ගණන	5,800.00
බැගයකට පොදුකාර්ය අන්තර්ග්‍රහණය (ඉහත පරිදි)	50.00
නිෂ්පාදිත ඒකක සඳහා පොදුකාර්ය (5,800 * 50)	290,000.00
අඩුකළා : වැඩියෙන් අන්තර්ග්‍රහණය කළ ප්‍රමාණය	(40,000.00)
අයවැයගත ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය (රු.)	250,000.00

(ඇ) (i) සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය = (ප්‍රමිත පිරිවැය - සත්‍ය පිරිවැය) මිලදීගත් සත්‍ය ප්‍රමාණය

හෝ

(ප්‍රමිත පිරිවැය * මිලදීගත් සත්‍ය ප්‍රමාණය) - (සත්‍ය මිල * මිලදීගත් සත්‍ය ප්‍රමාණය)

1 අමුද්‍රව්‍ය = (1,210,000/11,000 * 11,300 - (1,265,000)

(22,600)	අවාසි

11 අමුද්‍රව්‍ය = (7,040,000/44,000 * 46,900 - (7,504,000)

නැත	වාසි

(ii) සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය = (ප්‍රමිත භාවිතය - සත්‍ය භාවිතය) ප්‍රමිත මිල

1 අමුද්‍රව්‍ය = (11,000/5,500 * 5,800 - 11,300 * 110

33,000	වාසි

11 අමුද්‍රව්‍ය = (44,000/5,500 * 5,800 - 46,900 * 160

(80,000.00)	අවාසි

(iii) සෘජු ශ්‍රම අනුපාත විචලතාවය = (ප්‍රමිත පිරිවැය - සත්‍ය පිරිවැය) සත්‍ය පැය ගණන

= (660,000/2,750 - 650,000/ 2,600) * 2,600

(26,000.00)	අවාසි

(vi) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලතාවය = (ප්‍රමිත පැය ගණන - සත්‍ය පැය ගණන) ප්‍රමිත අනුපාතය

$= \left[(2{,}750/5{,}500) * 5{,}800 - 2{,}600\right] * 240$

72,000.00	වාසි

(v) ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය වියදම් විචලතාවය = අයවැයගත ස්ථාවර පොදුකාර්ය - සත්‍ය ස්ථාවර පොදුකාර්ය

= 250,000 - 280,000

(30,000.00)	අවාසි

(ඇ)

- බලාපොරොත්තු වනවාට වඩා අභිප්‍රේරණය වූ වැඩ පරිසරයේ පැවතීම.
- පුහුණු සේවකයින් පිරිසක් සිටීම.
- ශක්තිමත් අධික්ෂක මණ්ඩලයක් සිටීම.
- දීමනා මත පදනම් වූ ඵලදායිතා වැඩි කිරීම්
- බලාපොරොත්තු වනවාට වඩා ගුණත්වයෙන් යුතු ද්‍රව්‍ය තිබීම.
- බලාපොරොත්තු වනවාට වඩා පූර්ණත්වයෙන් පිරියත සහ යන්ත්‍ර ක්‍රියාත්මක වීම.
- පිහිටුවා ඇති ප්‍රමිත නිවැරදි නොවීම.

<u>පිළිතුර අංක 07</u>

(අ) (i) <u>කොටස් අනු විභේදනය</u>

සමාගමක් විසින් එහි දැනට ඇති කොටස, කලින් තීරණය කරන ලද අනුපාතයකට බෙදා/කොටස් කර, සමාගමේ කොටස් ගණන වැඩිකර ගැනීම මෙනමින් හැදින්වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම කොටස් මිලදී ගැනීම, පොදු ආයෝජකයන්ට සහනදායි කරමින් කොටස්වල මිල අඩුවනු ඇත. මෙම අනු විභේදනය හේතුකොට ගෙන ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනස්වීමක් සිදු නොවේ.

(ii) <u>හිමිකම් නිකුතුව</u>

හිමිකම් නිකුතුවේ දී, සමාගම විසින් රැස්කරගන්නා අතිරේක ප්‍රාග්ධනයට දායක වීම සඳහා ප්‍රථම අයිතිවාසිකම / හිමිකම දැනට සිටින කොටස් හිමියන්ට ලැබෙනු ඇත. වෙනත් ආකාරයකට කියන්නේ නම්, කලින් තීරණය කරනු ලබන අනුපාතයකට දැනට සටින කොටස් හිමියන්ට, කොටස් පිරිනැමීමය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩිවීමක් සිදු වේ.

(ආ) <u>කොටසක ශුද්ධ වත්කම් වටිනාකම</u>

2013 දෙසැම්බර් 31 දිනට

කොටස්කරුවන්ගේ අරමුදල් / නිකුතුවේ ඇති කොටස් ගණන (රු.)	36.00
<u>අනු විභේදනයෙන් පසු - 2013 ජනවාරි</u>	
5 :4 අනුපාතයට අනු විභේදනය කිරීම.	
එබැවින්, (36*4)/5	28.80

<u>2013 පෙබරවාර් හිමිකම් නිකුතුවෙන් පසු</u>

පැවති සෑම කොටස් 10 කටම රු. 24 බැගින් නව කොටස් 2 ක්

එබැවින්, [(28.80 *10) + (24 *2)] / 12	28.00

(ii) මූලිකව පැවති කොටස් ගණන මිලියන 40.00

5:4 ට අනු විභේදනය කිරීම	මිලියන 10.00
2:10 ට හිමිකම් නිකුතුව	මිලියන 10.00
	මිලියන 60.00

හිමිකම් නිකුතුවෙන් පසු කොටස් ගණන

මූලිකව ප්‍රකාශ කළ ප්‍රාග්ධනය	රු. මිලියන 1,000
හිමිකම් නිකුතුව	රු.මිලියන 240
නව ප්‍රකාශ කළ ප්‍රාග්ධනය	රු. මිලියන 1,240

(iii) හිමිකම් නිකුතුවට පෙර වෙළඳපොළ මිලෙන් 50% (රු.)	24.00
හිමිකම් නිකුතුවට පෙර වෙළඳපොළ මිල (රු.)	48.00
5:4 ට අනු විභේදනය කිරීමට පෙර (රු.) (48*$^5/_4$)	**60.00**

(ඇ) ඒකාබද්ධ කිරීම්, අත්පත් කරගැනීම් ආදියේදී

මූලික පොදු නිකුතුවට පෙර (IPO) - මූලික පොදු නිකුතු මිල තීරණය කිරීමට
ගිණුම්කරණ අරමුණු සඳහා සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමට
එක් පාර්ශවයකක් විසින් තවත් පාර්ශවයකට කොටස් මාරු කිරීමේදී
කොටස්, සුරකුම් ලෙස තබා ණයකින් අත්තිකාරමක් ලබාගැනීමේදී, කුමන ණයමත පදනම්ව
අත්තිකාරම නිකුත් කළේද යන්න දැනගැනීමට කොටසක වටිනාකම දැනගැනම අවශ්‍ය කෙරේ.

වරණීය කොටස් හෝ ණයකර, ස්කන්ධ කොටස් වලට පරිවර්තනය කිරීමේදී, පරිවර්තනය කළ යුතු වරණිය කොටස් හෝ ණයකර සඳහා නිකුත් කළ යුතු ස්කන්ධ කොටස් ගණන තීරණය කිරීම සඳහා, ස්කන්ධ කොටස් අගය කිරීම අවශ්‍ය කෙරේ.

(ඈ) මුල් වසර 5 සඳහා වර්තමාන අගය (රු.) මිලියන (3.3522x25)	මිලියන 83.81
අවුරුදු 5 සිට නිදහස් මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය(රු.) (30x6.667x0.4972)	මිලියන <u>99.44</u>
	මිලියන 183.25
මුළු කොටස් ගණන	මිලියන 40
කොටසක වටිනාකම (රු.)	**4.58**

නිවේදනය

මෙහි ලබාදුන් පිළතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.